


සිළුමිණ
சிழுமின The Silumina

■ ආරම්භය - 1930 මාර්තු 30 ■ ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී ■ 92 වැනි කාණ්ඩය 02 වැනි පත්‍රය ★
■ ශ්‍රී බුධ වර්ෂ 2564ක් වූ ධනු රවි 26 හාග උඳුවප් අව දොලොස්වක ඉරිදා ■ වර්ෂ 2021ක් වූ ජනවාරි මස 10 වැනි ඉරිදා මිල රු 80.00



රසඳුන හා ක්‍රීඩා අතිරේක
සිළුමිණ සමඟ


04 කොඩිකන්ද හිමි ඝාතනයේ අබිරහස


07 බිලියන 35ක ETI මගඩිය


08 මුතුරාජවෙල සටනට අගරදගුරුත් එක්වේ


15 අරුම පුදුම කැලණි පාලම


17 අතිබිහිසුණු බස්-දුම්රිය අනතුර


25 කඳුළින් නැහැවෙන පාහියන්ගල ජීවිත

# අඩු ආදායම් පවුල් ලක්ෂයකට රු. ලක්ෂයක සහන ණයක්

(ජයසිරි මුණසිංහ)

ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවලින් ඉහළ පොලියට ණය ලබාගෙන අධික ණය බරට ලක් වූ ග්‍රාමීය සහ අඩු ආදායම්ලාභී පවුල් ලක්ෂයකට අධික පිරිසකට වාර්ෂිකව 6%ක පොලියට රුපියල් ලක්ෂයක ණය මුදලක් ලබන පෙබරවාරි මස සිට ලබා දීමට රජය කටයුතු යොදා තිබේ.




...ටපුරා ක්‍රියාත්මක ක්ෂුද්‍ර මූල්‍ය ආයතන 37ක එකමුතුවකින් යුතු ක්ෂුද්‍ර ...ය සංගමයේ සහායද මෙම ණය ක්‍රමයට හිමිවන බව අමාත්‍යාංශයේ ...රේක ලේකම් (සංවර්ධන) සී.ඩී. කළුආරච්චි හෙළි කෙළේය.
...ැනට රටපුරා අවිධිමත් ආකාරයෙන් වාර්ෂිකව 40% සිට 200% දක්වා අධික ...ලියක් ලබා ගන්නා ක්ෂුද්‍ර මූල්‍ය ගනුදෙනු කරන ආයතන 3,000ක් පමණ ...ි බව වාර්තා වුවද ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි වී ඇත්තේ ක්ෂුද්‍ර ...ය සමාගම් 4ක් පමණි. ක්ෂුද්‍ර මූල්‍ය පනත බල ගන්වා ක්ෂුද්‍ර මූල්‍ය ආයතන ...කාරියක් පිහිටුවීමටද රජය මේ වන විට කටයුතු කරමින් සිටී.

## පවුල් සෞඛ්‍ය නිලධාරී අයදුම්පත් කැඳවයි

>> 2 වැනි පිටුවට

## නාගරාජ ශාක්‍ය පුත්‍ර ඥාති වෛද්‍ය ...



ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ 'නාගරාජ ශාක්‍ය පුත්‍ර ඥාති' වෛද්‍ය රක්ෂණ ක්‍රමය හඳුන්වාදීම අගමැති මහින්ද රාජපක්ෂයන්ගේ ප්‍රධානත්වයෙන් ජනවාරි 8 සිකුරාදා සිදු කෙරිණි. මේ යටතේ භික්ෂූන් වහන්සේගේ හා දසසිල් මාතාවන්ගේ මව පියා හෝ සහෝදර සහෝදරියන් රජයේ රෝහලක හෝ පෞද්ගලික රෝහලක රෝහල්ගත වීමකදී දිනකට රුපියල් 1000 බැගින් ගෙවනු ලබන අතර වෛද්‍ය පරීක්ෂණයකදී හෝ ඖෂධ සඳහා රුපියල් 25,000ක උපරිමයක් දක්වා ගෙවනු ලැබේ. මෙහි වාර්ෂික දායකත්වය රුපියල් 2,000ක් පමණ වන අතර එය පුණ්‍ය කටයුත්තකදී සැදැහැවතුන්ට පූජා කිරීමේ හැකියාව ඇත. ශ්‍රී ලංකාවේ විහාරස්ථාන 9,962ක් ඇති අතර ඒවායේ වැඩසිටින භික්ෂූන් වහන්සේගේ සංඛ්‍යාව 40,595කි. මින් 19,580ක් උපසම්පදා භික්ෂූන් වන අතර සෙසු පිරිස සාමණේර හිමිවරුන්ය. ඊට අමතරව දසසිල්මාතාවන් 2,168ක්ද ශ්‍රී ලංකාවේ වැඩ වසති.

## ගම හදන්න කෝටි 65,000 ක්

(නිහාල් පී. අබේසිංහ)

ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනය කරමින් පුද්ගලයන් ලක්ෂ 190කට පමණ සෙත සැලසීම සඳහා මේ වසරේ අයවැය මඟින් රුපියල් කෝටි 65,000 ක් වෙන්කර ඇතැයි මුදල් අමාත්‍යාංශ ලේකම් එස්.ආර්. ආටිගල පවසයි.

>> 2 වැනි පිටුවට

## කොරෝනා ප්‍රතිකාර පෞද්ගලික අංශයටත්

(භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්)

පෞද්ගලික අංශයේ රෝහල්වලට කොරෝනා ප්‍රතිකාර මධ්‍යස්ථාන පවත්වාගෙන යෑම සඳහා අවසර ලබාදීමට තීරණය කර ඇති බව යුද හමුදාපති ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා 'සිළුමිණ'ට පැවසීය.

සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් දී ඇති නිර්දේශයන්ට අනුව හෝටල්

## ටියුෂන් පන්ති නියාමනයට පියවර

(සුභාෂිණී ජයරත්න)

පෞද්ගලික උපකාරක පන්ති නියාමන කිරීම සම්බන්ධව අවධානය යොමුව ඇතැයි අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් මහාචාර්ය කපිල සී. පෙරේරා සිළුමිණට කීය.

අමාත්‍යාංශයට දිගින් දිගටම පැමිණෙන පැමිණිලි නිසා එසේ පෞද්ගලික උපකාරක පන්ති නියාමනය සම්බන්ධව අවධානය යොමු කර ඇතැයි ඔහු පෙන්වා දුන්නේය. පෞද්ගලික උපකාරක පන්ති නියාමනයට අධ්‍යාපන අමාත්‍යාංශයට සෘජු බලයක් නොමැති වුවද, ව්‍යවස්ථාපිතව සිසු දරුවන්ගේ සියලු අධ්‍යාපන කටයුතු සම්බන්ධ වගකීම අධ්‍යාපන අමාත්‍යාශය සතු

>> 2 වැනි පිටුවට



## ගුවන් මඟින් ගෙන්වීම කාණ්ඩ 4ක් යටතේ

## තිතට මත් වෙන්න